**මාතලේ මහා නගර සභාව**

**මාතලේ දිස්ත්‍රික්කය**

---------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1:1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 23 දින ,ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 10 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1:2 මතය

------

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මාතලේ මහා නගර සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1. 3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

1:3:1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

(අ) 2010 වර්ෂයට අදාළව ගෙවිය යුතු රු.209,747 ක වියදම් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා වර්ෂයේ වියදම සහ ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වටිනාකම රු.3,296,496 ක් වූ හිඟ ආදායම්, ආදායම් ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ගබඩා තොගයේ වටිනාකම රු.1,519,058 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2009 වර්ෂයට අදාළව හිඟ කඩකුලී වෙනුවෙන් අදාළ තැන්පතු ගිණුමෙන් හිලව් කර ඇති රු.10,000 ක කුලියක් 2010 වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා හිඟ කඩකුලි රු.10,000 ක් අඩුවෙන්ද වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද දක්වා තිබුණි.

(ඉ) පසුගිය වසර 06 ක කාලයක් සඳහා ගෙවිය යුතුව තිබූ රු.1,286,867 ක විගණන ගාස්තු සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තුව ලෙස, පසුගිය වර්ෂයේ බිල්කල විගණන ගාස්තුව වූ රු. 612,561 කින් අඩකටත් වඩා අඩු මුදලක් එනම් රු.300,000 ක් පමණක් වෙන්කර තිබුණි.

(ඊ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.134,431,087 හා පෞද්ගලික සමාගමකට ගෙවිය යුතු රු.5,819,753 ක ණය මුදලට අදාළ ගෙවිය යුතු පොලී ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සකස් කළ අංක 22710986 හා අංක 72710984 දරන ගිණුම් වලට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව බැංකුවේ තැන්පත් නොකල පිළිවෙළින් රු.165,813 ක හා රු.14,913 ක මුදල් ශේෂ පැවතුනද ඒවා ශේෂ පත්‍ර සටහන් වල නිළධාරීන් වෙත ඇති මුදල් යටතේ අනාවරණය කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ මිළදී ගන්නා ලද පුස්තකාල පොත් වල වටිනාකම රු.8,572 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා පුස්තකාල පොත් ගිණුමේ හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය එකී ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) 2009 වර්ෂයේදී වෙන්දේසි මගින් විකුණා තිබූ අංක 49-9306 දරන රු.98,750 ක වටිනා කමැති වතුර බවුසරයේ වටිනාකම සහ වාරික වශයෙන් අයකර ගැනීමේ පදනම මත විකුණා තිබූ රු.4,204,895 ක් වටිනාකමැති අංක ඩබ්පීජ්එල් 9357 දරන ගලි බවුසරයේ වටිනාකම මෝටර් රථ හා කරත්ත ගිණුමෙන් ඉවත් කර නොතිබුණි.

(ඒ) සභාව සතු එස්කැවේටර් යන්ත්‍රයේ වටිනාකම වූ රු.5,000,000 ක් මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) මාසික බදු පදනම මත ලබාගෙන තිබූ දුම්රිය බඩු ගබඩාව වෙනුවෙන්,2010 දෙසැම්බර් 31 දිනට දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.1,883,700 ක බදු කුලිය ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ අයකරගෙන තිබූ මාර්ග තලනයේ ගාස්තු,අවමංගල රථ ගාස්තු,පුරහල කුලීයට දීමේ ගාස්තු රු.202,242 ක් ආදායමට ගෙන නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය සහ ඊට පෙර වර්ෂ වලදී කොම්පෝස්ට් පොහොර බැරල් විකිණීමෙන් ලද රු.609,200 ක ආදායමක් ඒ ඒ වර්ෂ වලදී ආදායමට ගැනීමෙන් තොරව ශේෂ පත්‍රයේ සමුච්චිත අරමුදල් හා සංචිත යටතේ දක්වා තිබුණි.

(ග) සභාව සතු ගිලන් රථයක් වාරික වශයෙන් අයකර ගැනීමේ පදනම මත විකුණා තිබූ අතර, එයින් ලද රු.1,384,876 ක මුදලක් ආදායමට නොගෙන ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

1:3:2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

ගිණුම් විෂයයන් 5 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.175,159,228 ක් වූ අතර උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.164,815,545 ක් විය.

1:3:3 ගෙවිය යුතු ගිණුම්

-------------------

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම 28,747,937 ක් විය.

1:3:4 විගණනය සඳහා සාක්ෂ නොවීම

-----------------------------------

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

------------------------------------

2010 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 36 කට පිළිතුරු සපයා නොතිබූ අතර, එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු.103,177,903 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

-------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.121,380,235 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඇ) ලේඛන පැවැත්වීම

පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණි.

(i) ණයගැති ලේඛනය

(ii) ස්ථාවර වත්කම් ලේඛනය

(iii) හානි ලේඛනය

1:3:5 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති,රීති,රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) <u>මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය)</u> | |
| (i) 186 වගන්තිය | කිසියම් බැංකු ගිණුමක් විවෘත කිරීමට නියමිත බැංකුව පිළිබඳව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් අමාත්‍යවරයා විසින් නිශ්චය කර දැක්විය යුතු වුවත් එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව බැංකු ගිණුම් හතරක් විවෘත කර තිබුණි. |
| (ii) 216 වගන්තිය | කවර ශිර්ෂයක් යටතේ වුවද වියදම් අඩුකිරීම වැඩිකිරීම හා මාරු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන එම වියදම් දැරීමට කලින් සලසා ගත යුතු වුවද එම විධිවිධාන වලට පටහැනව වැය ශිර්ෂ 49 ක් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඉක්මවා රු.1,715,257 ක වියදම් දරා තිබූ අතර වෙන්කරන ලද ප්‍රතිපාදන ඉක්මවා අවස්ථා 2 කදී රු.35,494 ක වියදම් වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණ. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ 371(ඇ) | දෙන ලද තත්කාර්ය අතුරුඅග්‍රිම අදාළ කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත්, 2008 පෙබරවාරි 07 සිට 2009 දෙසැම්බර් 29 දක්වා අවස්ථා 09 කදී දෙන ලද රු.144,280 ක අත්තකාරම් විගණිත දින වූ |

| | |
|---|---|
| | 2010 අගෝස්තු 25 වන විටත් පියවා නොතිබුණු අතර 2010 වර්ෂයේ අවස්ථා 09 කදී දෙන ලද රු.96,627 ක අත්තකාරම් පියවීමේදී දින 19 සිට 172 දක්වා ප්‍රමාදයන් දක්නට ලැබුණි. |
| (ii) මු.රෙ 571 | ඉකුත් තැන්පතු පිළිබඳව කටයුතු කළ යුතු වුවද, රු.4,880,683 ක තැන්පතු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (iii) මු.රෙ 1646 | 2009 වර්ෂයේ වාහන 28 ක හා 2010 ජුලි 31 දක්වා වාහන 31 කට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ 2010 සැප්තැම්බර් 15 දක්වාද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) <u>ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය</u><br>xxiv පරිච්ඡේදයේ 10:4 උපවගන්තිය | සමාලෝචිත වර්ෂයේදී නිළධාරීන් තිදෙනෙකු වෙත රු.435,000 ක ආපදා ණය ගෙවීමේදී නියමිත සේවා කාලයක් සම්පූර්ණ කර තිබූ ඇපකරුවන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) <u>මුදල් රෙගුලාසි 880 හා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ 2003 අප්‍රේල් 11 දිනැති සිපිසි/සිඑස්/06/06/02 චක්‍රලේඛය</u> | ඇප තැබිය යුතු කිසිදු නිළධාරියෙකු විසින් බැංකු ගිණුමක් මගින් හෝ රක්ෂණ ඔප්පුවක් මගින් ඇප තබා නොතිබුණි. |
| (ඉ) <u>රාජ්‍ය මුදල් චක්‍රලේඛ</u><br>2009 සැප්තැම්බර් 18 දිනැති අංක පිඑෆ් 437 චක්‍රලේඛය | රාජ්‍ය අංශයට අයත් වාහන වල රක්ෂණ ආවරණ සෘජුවම ජාතික රක්ෂණ භාර අරමුදලෙන් හෝ සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් ලබාගත යුතු අතර ඒ සඳහා ගෙවීම් කිරීමේදී නියෝජිතයින් මගින් ගෙවීම් නොකළ යුතු වුවද, එකී විධිවිධාන වලට පටහැනව සභාවට අයත් වාහන 50 ක් සමාලෝචිත වර්ෂයේදී පෞද්ගලික රක්ෂණ සමාගම් වලින් රක්ෂණය කරවාගෙන ඒ සඳහා රක්ෂණ නියෝජිතයෙකු වෙත ගෙවීම් කර තිබුණි. |

(ඊ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 1990 ඔක්තෝබර් 10 දිනැති හා අංක 41/90 චක්‍රලේඛය | සෑම මාස 06 කට වරක්ම වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවද, සභාව සතු කිසිදු වාහනයක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 චක්‍රලේඛය | වාහන වල රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම සඳහන් කළ යුතු වුවද, සභාව සතු වාහන 04 ක් වෙනුවෙන් ඒපරිදි කටයුත කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.235,911 ක් වූ අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,493,973 ක් විය.

### 2:2 ආදායම් පරිපාලන

#### 2:2:1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 16,225 | 16,861 | (636) | 17,500 | 16,401 | 1,099 |
| (ii) බදු කුලි | 12,898 | 10,885 | 2,012 | 15,510 | 13,021 | 2,489 |
| (iii) බලපත්‍ර ගාස්තු | 3,860 | 3,794 | 66 | 3,870 | 4,075 | (205) |
| (iv) වෙනත් ආදායම් | 43,647 | 40,645 | 3,602 | 46,448 | 43,006 | 3,442 |

2:2:2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.2,367,426 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2:2:3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.7,533,193 ක මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 ජල ගාස්ත

සභාව සතු ජලසැපයුම් පද්ධතිය 2004 වර්ෂයේ සිට ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය වෙත පවරාදීමේදී පැවති රු.4,802,812 ක ශේෂයක් අදාළ ජලපාරිභෝගිකයන් වෙතින් අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

2:3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාළ විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| පෞද්ගලික පඩිනඩි | 111,359 | 112,022 | (663) | 107,503 | 111,400 | (3,897) |
| අනෙකුත් | 45,295 | 61,005 | (15,710) | 55,696 | 57,619 | (1,923) |
| උප එකතුව | 156,654 | 173,027 | (16,373) | 163,199 | 169,019 | (5,820) |
| ප්‍රාග්ධන වියදම | 7,620 | 7,162 | 458 | 19,595 | 4,241 | 15,354 |
| මුළු එකතුව | 164,274 | 180,189 | (15,915) | 182,794 | 173,260 | 9,534 |

## 2.4 අධිභාර

මහා නගර සභා ආඥා පනත ( 252 වන අධිකාරය) යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මව්සින් පනවන ලද අධිභාර අනුව 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර වල අගය රු.50,857 ක් විය.

## 2.5 මානව සම්පත් කළමනාකරණය

### 2.5.1 අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 10 | 09 |
| ද්විතියික | 97 | 93 |
| ප්‍රාථමික | 296 | 294 |
| වෙනත්(අනියම්/තාවකාලික) | - | 81 |

(ආ) විධිමත් අනුමැතියකින් තොරව අනියම්/තාවකාලික සේවකයින් 81 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ඇ) සභාවට කිසිදු සේවයක් ලබානොගෙන 2010 ජුනි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාළව කම්කරුවෙකුට රු.135,180 ක මුදලක් ගෙවා තිබුණි.

## 2.6 වත්කම් කළමනාකරණය

### 2.6.1 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

වටිනාකම රු.553,750 ක් වූ භෞතික සම්පත් නිෂ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවැති බව නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

### 2.6.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.33,549,586 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.13,981,516 ක් විය.

2.6.3 අයවීමට ඇති සේවක ණය
-----------------------------

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂ වල වටිනාකම රු.8,181,032 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂ වල වටිනාකම රු.856,422 ක් විය. 1995 දෙසැම්බර් 27 දිනැති අංක 95/9 දරන මධ්‍යම පළාතේ ගිණුම් චක්‍රලේඛයෙ 5 ඡේදය පරිදි නිලධාරීන් විශ්‍රාම ගැනීමේදි හා ස්ථාන මාරුවී යාමේදී ණය ශේෂ පියවන තුරු ඊට අදාළව පසු විපරම් කටයුතු සිදු නොකිරීම නිසා ස්ථාන මාරුවී ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 131 දෙනෙකුගේ රු.829,791ක ණය ශේෂයක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

2.6.4 අචල ජංගම වත්කම්
-----------------------

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම් වල අගය රු.5,488,449 ක් විය.

2.6.5 සමීක්ෂණය නොකළ වත්කම්
--------------------------------

භෞතික සමීක්ෂණ/සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.82,386,147 ක් විය.

2.7 හඳුනාගත් පාඩු හා හානි
----------------------------

අංක 301-3445 හා අංක කේඑච්-4277 දරන වාහන වලට පිළිවෙළින් 2008 ඔක්තෝබර් 30 දින හා 2009 මාර්තු 30 දින වල සිදුවී තිබූ අනතුරු සම්බන්ධයෙන් පොලිස් පැමිණිලි සහ පොලිස් වාර්තා නොතිබූ අතර, ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 104(1)(අ) අනුව අලාභයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා,2010 අගෝස්තු මාසය තෙක් පරීක්ෂණ ආරම්භ කර නොතිබුණි.

2.8 ආර්ථික නොවූ ගණුදෙනු

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුරවැසි සේවා ප්‍රඥාප්ති පොත් පිටපත් 4000 ක් මුද්‍රණය කිරීම සඳහා සංවර්ධන ගිණුමෙන් 2009 දෙසැම්බර් 18 දින රු.129,500 ක් ගෙවීම් කර තිබුණි. විගණිත දින වූ 2010 සැප්තැම්බර් 17 වන විට මුද්‍රණයෙන් පසු මාස 09 ක් ගතවී තිබියදීත්, මුද්‍රණය කර තිබූ පිටපත් 4000 න් පිටපත් 3205 ක් බෙදානොහැර ගබඩාවේ තිබූ අතර, බෙදා හැර තිබූ පිටපත් 795 බෙදාහැරී ආකාරය ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එම පිටපත් මුද්‍රණය කිරීම සඳහා ආසියානු පදනම මගින් ලබාදී තිබූ මුදල රු.261,600 ක් වූ අතර, ඒ මගින් වැය නොකළ රු.132,100 ක් 2010 දෙසැම්බර් 31 දින වන විටත් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) දෛනික පොල පැවැත්වීම සඳහා මාසික බදු පදනමට ලබාගෙන තිබූ දුම්රිය බඩු ගබඩාව සඳහා 2007 නොවැම්බර් මස සිට 2010 දෙසැම්බර් 31 වන විට ගෙවිය යුතු බදු කුලිය රු.1,883,700 ක් වන අතර එම කාලය තුල ලැබී තිබූ ආදායම රු.467,651 කි. ඒ අනුව එම කාලය තුල එමගින් සභාවට සිදුවී ඇති පාඩුව රු.1,416,049 කි.

2.9 අවිධිමත් ගණුදෙනු

-------------------

(අ) මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 188 වගන්තියේ විධිවිධාන අනුව මහා නගර සභා අරමුදල ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන සලස්වා නොමැති කාර්යයන් වූ විසිටින් කාඩ්පත් හා අලුත්අවුරුදු සුභපැතුම්පත් මුද්‍රණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු.35,325 ක මුදලක් වැය කර තිබුණි.

(ආ) මහා නගර සභා අතුරු ව්‍යවස්ථා (v) කොටසෙහි 4(අ) ඡේදයේ විධිවිධාන අනුව රු.50,000 කට වැඩි මිළදී ගැනීම් වලදී පුවත්පත් වල දැන්වීම් පළ කර විවෘත මිළ ගණන්මත මිළදී ගැනීම කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී රු.247,311 ක් වටිනා පාසැල් උපකරණ හා පොත් පත් මිළදී ගැනීම් වලදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.මෙම මිළදී ගැනීම් වලදී ලියාපදිංචි සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් පමණක් ලබාගත් මිළ ගණන් මත මිළදී ගැනීම් කර තිබුණි.

(ඇ) 2003 දෙසැම්බර් 11 දිනැති අංක 11/309 ඊ 83/v චක්‍රලේඛයේ විධිවිධාන අනුව භාෂා පරිවර්තන ගාස්තු ගෙවීමේදී පරිවර්තන කරනු ලබන වචන සංඛ්‍යාව අනුව සිදුකළ යුතු වුවත් ඊට පටහැනිව, නාගරික කොමසාරිස්වරයාගේ අනුමැතිය පරිදි මාසික ස්ථාවර ගාස්තුව මත

සහා වාර්තා දෙමළට පරිවර්තනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.135,000 ක් වැය කර තිබුණි.

(ඈ) පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය 1984 නොවැම්බර් 20 දිනැති අංක 1984/19 (ඌ)චක්‍රලේඛය4:2 හා 6:1 ජේද අනුව ඉලක්කගත මුලු වරිපනම් ආදායමෙන් 75% ක් ඉක්මවා රැස් කිරීම් වලින් 3% ක ප්‍රමාණයක් ආදායම් රැස්කරන නිළධාරින්ට දිරිදීමනා ලෙස ගෙවිය හැකි වුවද, එම විධිවිධාන වලට පටහැනව 2010 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ජේදය තුල එකතු කරන ලද මුළු වරිපනම් ආදායම මත දිරිදීමනා ගණනය කර රු.239,240 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

2.10 මෙහෙයුම් ආකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008 හා 2009 වර්ෂ වලදී බාහිර පාර්ශවයන් වෙත අවස්ථා 03 කදී දෙනු ලැබූ රු.91,800 ක අත්තකාරම් මුදල් 2010 දෙසැම්බර් 31 දින වන විටත් පියවාගෙන නොතිබු අතර, අත්තිකාරම් දීම සඳහා සුදුසු සරක්ෂණයක් හෝ ලබාගෙන නොතිබීමේ හේතුවෙන් එම මුදල් ආපසු අයකර ගැනීමට නොහැකිවී තිබුණි.1994 වර්ෂයේ සිට දෙන ලද අත්තිකාරම් වලින් 2010 දෙසැම්බර් 31 දින වන විට රු.2,660,909 ක් නොපියවූ අත්තීකාරම් ශේෂයක් පැවතුණි.

(ආ) සභාවේ නිල බැංකු ගිණුමෙන් අයිරා පහසුකම් ලබාගෙන ඒ සඳහා පොලි ගෙවමින් තිබියදී,කසල බැහැර කිරීම සඳහා උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඉඩමක් අත්පත් කර ගැනීම පිණිස , 2008 අප්‍රේල් 01 දින රු.4,400,000 ක් වැය කර තිබුණි. පසුව එම ඉඩම අත්පත් කර ගැනීම අතහැර දමා තිබූ අතර ඉන් වසර 02 කට පසුව එනම් 2010 මැයි මාසයේදී එම මුදල ආපසු ලබාගෙන තිබුණි. එම කාල සීමාව තුල බැංකු ගිණුම වෙනුවෙන් අයිරා පොලි වශයෙන් රු.1,036,551 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) කම්කරු තනතුරු වලට බඳවාගත් සේවකයින් 09 දෙනෙකු පසුව රියදුරු තනතුරු වලට බඳවාගෙන තිබූ අතර, එකී තනතුරු වලට පත්කිරීමේදී අවශ්‍ය බර වාහන පැදවීමේ බලපත්‍ර තිබූ බවට තහවුරු කර ගැනීමක් කර නොතිබුණි.

(ඈ) 2010 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබූ නොගෙවූ විශ්‍රාම වැටුප් හා නොගෙවූ වැටුප් රු.4,892,000 ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කසල භාජන අත්තකාරම් රු.545,237 ක ඍණ ශේෂයක් අයකර ගතහැකි උපයෝගී සේවා යටතේ වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එන නමුත් ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(උ) සරප් වංචා කළ මුදල් ලෙස රු.26,549 ක ශේෂක් ශේෂ පත්‍රයේ මුදල් ශේෂ යටතේ දක්වා ඇතත්, ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

(ඌ) සංවර්ධන අරමුදල ලෙස රු.154,181 ක් ශේෂ පත්‍රයේ සමුච්චිත අරමුදල හා සංචිත යටතේ වර්ෂ ගණනාවක සිට දක්වා තිබුණි.

(එ) 2010 වර්ෂය තුල භාණ්ඩ හා සේවා ලබා ගැනීම පිණිස සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා රු.56,700 ක වියදමක් දරා සිංහල දෙමළ හා ඉංග්‍රිසි පුවත්පත් වල දැන්වීම් පල කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 12 කදී එසේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිළදී නොගෙන රු.3,132,500 ක් වැය කර 2009 වර්ෂයේ මිළ ගණන් පදනම් කරගෙන මිළදී ගෙන තිබුණි.

(ඔ) පොල භූමිය පවත්වාගෙන යනු ලබන දුම්රිය ගබඩාවේ වෙළදුන් විසින් ගෙවිය යුතු විදුලි බිලපත් නොගෙවීම නිසා විදුලිය විසන්ධි කර තිබුණි.නැවත විදුලි සම්බන්ධතාවය ලබාගැනීම සඳහා නගර සභා අරමුදලින් රු.20,000 ක් ගෙවා තිබු අතර ඉතිරි රු.107,219 ක මුදල සභා අරමුදලින් කොටස් වශයෙන් ගෙවීමට ද එකඟවී තිබුණි.පොල වසා තිබූ කාලයට අදාළ රු.43,281 ක විදුලිය බිල්පත්ද ඊට ඇතුළත්ව තිබුණි.

2.11 ගබඩා පාලනය
------------------

(අ) ගබඩා තොග පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂණ වලදී රු.597,825 ක තොග අතිරික්තයක්ද, රු.60,637 ක තොග ඌණතාවයක්ද නිරීක්ෂණය විය.

(ආ) මුදල් රෙගුලාසි 715(1)(ආ) ප්‍රකාරව ගබඩා භාණ්ඩ විධිමත්ව භාරයේ තබා ගැනීම, ඒවා මනා තත්ත්වයෙන් පවත්වා ගැනීම, ඕනෑම අවස්ථාවකදි පහසුවෙන් සොයාගෙන හර් වැරදි බැලිමට හැකි පරිද්දෙන් තබා ගැනීම කළ යුතු වුවද, රෝස විදියේ පිහිටි මහා නගර සභා ගොඩනැගිලි ද්‍රව්‍ය අංගනයේ වැලි ,ගල් හා ගඩොල් වැනි ගොඩනැගිලි ද්‍රව්‍ය ඒ පරිදි නිසි ලෙස ගොනු කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාස 762 ප්‍රකාරව ප්‍රමාණවත් තොග පවත්වා ගැනීම අදාළ ගබඩා භාර නිළධාරියාගේ වගකීම වුවත් ඒ පරිදි තොග මට්ටම් පවත්වා නොතිබුණි.

2.12 කාර්ය සාධනය

-----------------

(අ) සභාවට පැවරී තිබූ ආදායම් මාර්ගවලින් එකතු කරගත හැකිව තිබූ ආදායම රු.72,185,643 ක් වූ අතර සභාව පවත්වාගෙන යාමට වර්ෂය තුල දරන ලද පුනරාවර්තන වියදම රු.173,027,919 ක් විය. එයින් සභාවේ සේවක වැටුප් සඳහා දරා තිබූ වියදම රු.112,022,400 ක් වූ අතර, වැටුප් ගෙවීම සඳහා හෝ සභාව එකතු කළ ආදායම ප්‍රමාණවත් නොවීය.තවද සභාවට පැවරුණු ආදායම් මාර්ග තුල ආදායම් වැඩිකර ගැනීමට අවශ්‍ය ක්‍රමෝපායන් කිසිවක් අනුගමනය කර නොතිබුණු බවද දක්නට ලැබුණි. පළාත් සභාවෙන් ලැබුණු රු.100,606,364 ක ආදායම් ආධාර එකතු කරගත් පසුවද රු.235,912 ක ආදායම ඉක්මවූ වියදමක් වූ අතර ඒ තුළින් පුනරාවර්තන වැය හෝ පියවාගත නොහැකි බව දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේදී උපකරණ වැය ලෙස රු.7,162,108 ක් වැය කර තිබූ අතර, වර්ෂය අවසානයට ආදායම් හා වියදම් ගිණුමේ ඌණතාවය රු.6,231,529 ක් විය. වාර්ෂික අයවැය ලේඛනය මගින් වෙන්කරන ලද ප්‍රතිපාදන ඉක්මවා රු.16,373,369 ක් වැය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස රු.171,831,500 ක් එකතු කළ යුතු බවට හා රු.156,654,550 ක් වැය කිරීමට අයවැය ලේඛනය මගින් අනුමත කර තිබුණද එකී සීමාවන් තුල කටයුතු කිරීමට හා නගරයේ අභිවෘද්ධිය හා සංවර්ධන කටයුතු සඳහා වියදම් දැරීමට සභාව උත්සුක වී නැති අතර සංවර්ධන කටයුතු වලට ප්‍රවිශ්ඨවීමට සැලසුම් සකස් කිරීමට හෝ පෙළඹී ඇති බවක් දක්නට නොලැබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික අයවැය ලේඛනයෙන් වැය විෂයයන් 07 ක් යටතේ සංවර්ධන යෝජනා සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද ඒවා ඉටුකර නොතිබුණි.

(ඇ) වාර්ෂික අයවැය ලේඛනයෙන් අනුමැතිය ලබාගෙන නොතිබූ සංවර්ධන යෝජනා 03 ක් ඉටුකර තිබණි.

2:13 අභ්‍යන්තර විගණනය

----------------------

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන
-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අභ්‍යන්තර පාලනය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) තොග පාලනය
(උ) ණයගැති හා ණයහිමි පාලනය